## වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

## නැෂනල් ඇග්‍රි මාර්කට් සර්විස් ලිමිටඩ් (NAMS)

## විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සංකීර්ණය

## අංක 44, කිරිමණ්ඩල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.

### කෘෂිකාර්මික වෙළෙඳපොළ සඳහා ජාතික ආයතනයක් ගොඩනැගීම

නැෂනල් ඇග්‍රි මාර්කට් සර්විස් ලිමිටඩ්හි (NAMS) යනු ශ්‍රී ලංකාව පුරා පිහිටි විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන (DECs) 18 ක කළමනාකරණය සහ සංවර්ධනය පරිවර්තනය කිරීමේ ජාතික වගකීමක් සහිතව අලුතින් පිහිටුවන ලද 100% ක් රජය සතු සමාගමකි.

කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ මහජන වටිනාකම ශක්තිමත් කරන අතරම, ගොවීන්ට, වෙළෙඳුන්ට සහ පාරිභෝගිකයින්ට වඩාත් හොඳින් සේවය සපයන නවීන, ක්‍රියාශීලී සහ වෘත්තීයමය වශයෙන් කළමනාකරණය කරන ලද වෙළෙඳ පරිසරයන් නිර්මාණය කරමින් මෙම මධ්‍යස්ථාන ඊළඟ මට්ටමට ගෙන යාම සඳහා NAMS පිහිටුවා ඇත.

අනාගතය සඳහා ශක්තිමත් පද්ධති ස්ථාපිත කරමින් NAMS සිය ආයතනය ගොඩනැගීමේ මෙම වැදගත් අදියරට පිවිසෙන විට, පහත තනතුර සඳහා සුදුසුකම්ලත් සහ පළපුරුදු වෘත්තිකයෙකුගෙන් සමාගම විසින් අයදුම්පත් කැඳවනු ලැබේ:

### ප්‍රධාන විධායක නිලධාරී

ඵලදායී පද්ධති ස්ථාපිත කිරීම, මෙහෙයුම් විනය ශක්තිමත් කිරීම, අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය ආයතන සහ පාර්ශ්වකරුවන් සමග සම්බන්ධීකරණය කිරීම සහ රට පුරා සමාගමේ ශ්‍රම බලකාය සහ මෙහෙයුම් මෙහෙයවීමේ වගකීම සහිතව, NAMS වෙත සමස්ත පරිපාලන සහ ආයතනික නායකත්වය සැපයීම ප්‍රධාන විධායක නිලධාරී විසින් සිදු කරනු ඇත.

සුදුසුම අපේක්ෂකයා වනුයේ නව ආයතනයක් ගොඩනැගීමට, තීරණ ක්‍රියාවට නැංවීමට සහ වෘත්තීයභාවයෙන්, කැපවීමෙන් සහ ජාතික වගකීම පිළිබඳ දැඩි හැඟීමකින් යුතුව නායකත්වය දීමට හැකියාව ඇති පළපුරුදු පරිපාලන නායකයෙකි.

### සුදුසුකම් සහ පළපුරුද්ද

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කෘෂිකර්මය/ කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය/ විද්‍යාව සහ අලෙවිකරණය හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක්

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ කළමනාකරණය පිළිබඳ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය.

### පළපුරුද්ද

පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළෙඳ ආයතනයක සාර්ථක වාර්තාවක් සහිතව කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර දහහතක (17) පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් වසර පහක් (05) ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ පළපුරුද්ද විය යුතුය.

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කෘෂිකර්මය, කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, විද්‍යාව

**සහ**

අලෙවිකරණය හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් (PhD).

### පළපුරුද්ද

ආචාර්ය උපාධිය (PhD) ලබා ගැනීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළෙඳ ආයතනයක සාර්ථක වාර්තාවක් සහ කළමනාකරණ අත්දැකීම් සහිතව ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද.

### වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛ අංක 01/2025 HM 2-1 - 2025 රු. [161,140 - 12 X 4,850 - 219,340]

### වෙනත් මූල්‍ය ප්‍රතිලාභ

රු. 50,000 ක ප්‍රවාහන දීමනාව, ලීටර් 145ක ඉන්ධන දීමනාව රු. 17,800ක ජීවන වියදම දීමනාව (COL), රු. 25,000ක වෘත්තීය දිමනාව සහ PED 02/2022 චක්‍රලේඛයට අනුව සත්කාරක දීමනාව.

### අයදුම් කිරීමේ පටිපාටිය

අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද සනාථ කරන සහතිකහි පිටපත් මෙන්ම ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ සම්බන්ධතා විස්තර ද සමග සම්පූර්ණ ජීව දත්ත සටහනක් (BIO DATA) ඇතුළත් අයදුම්පත්, 2026 ඔක්තෝබර් 25 දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතු අතර, ඔබ අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සලකුණු කරන්න.

**සභාපති,**
**නැෂනල් ඇග්‍රි මාර්කට් සර්විස් ලිමිටඩ්,**
**විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සංකීර්ණය,**
**අංක 44, කිරිමණ්ඩල මාවත,**
**කොළඹ 05.**

**දුරකථන : 011 2506 939 - සභාපති**
**විද්‍යුත් තැපෑල : namslpb@gmail.com**

Gazette.lk